මගේ අංකය : ED/02/03/02/04 (II)
ශ්‍රී ලංකා සුරාබදු දෙපාර්තමේන්තුව
අංක 353, කෝට්ටේ පාර,
රාජගිරිය
2023.05. 19

නියෝජ්‍ය සුරාබදු කොමසාරිස්
(සැපයුම්දාම නියාමන හා තොරතුරු තාක්ෂණ) මඟින්
ස්ථානාධිපති (තොරතුරු තාක්ෂණ)

<u>වෙබ් අඩවියේ පල කරන සෙ ඉල්ලීම</u>

මේ සමඟ ඉදිරිපත් කරන නියෝජ්‍ය සුරාබදු කොමසාරිස් තනතුර සඳහා අයදුම්පත් කැඳවීමේ නිවේදනය ශ්‍රී ලංකා සුරාබදු දෙපාර්කමේන්තුවේ වෙබ් අඩවියේ පල කිරීමට කටයුතු කරන ලෙස කාරුණිකව දන්වමි.

රෝහණ සේනාරත්න
සුරාබදු කොමසාරිස් (පාලන හා මානව සම්පත්0

## රාජ්‍ය සේවා කොමිෂන් සභාව

**ශ්‍රී ලංකා සුරාබදු දෙපාර්තමේන්තුවේ නියෝජ්‍ය සුරාබදු කොමසාරිස් තනතුරට උසස් කිරීම සඳහා වන අයදුම්පත් කැඳවීමේ නිවේදනය**

සුරාබදු දෙපාර්තමේන්තුවේ පුරප්පාඩු වී පවතින නියෝජ්‍ය සුරාබදු කොමසාරිස් තනතුරේ පුරප්පාඩු 05ක් සඳහා සුදුසුකම් ලත් සියළුම සහකාර සුරාබදු කොමසාරිස්වරුන්ගෙන් අයදුම්පත්‍ර කැඳවනු ලැබේ.

**1. තනතුරට අදාල වැටුප් ක්‍රමය :**

2016.02.25 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍ර ලේඛ අංක 03/2016 හි විධි විධානයන්ට අනුව SL-1-2016 වැටුප් බණ්ඩයට අදාල වැටුප් පරිමාණය වන රු. 47,615 – 1,335 X 10 – 1,630 X 8 – 2,170 X 17 – 110,895/= (මාසික) මෙම තනතුරට හිමිවන අතර එහි 12 වන පියවර මෙම තනතුරේ ආරම්භක වැටුප් පියවර වේ.

**2. වයස් සීමාව:** අදාල නොවේ.

3. අධ්‍යාපන හා වෙනත් සුදුසුකම්

I. අයදුම්පත් කැඳවීමේ අවසාන දිනට සහකාර සුරාබදු කොමසාරිස් තනතුරේ අවම වශයෙන් වසර තුනක (03) සක්‍රීය හා සතුටුදායක සේවා කාලයක් තිබීම
II. සහකාර සුරාබදු කොමසාරිස් තනතුරට ස්ථිරව පත් කර තිබිය යුතුය.
III. තනතුරට අදාලව කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය නියමිත දිනට සමත්ව තිබීම.
IV. පිළිගත් රාජ්‍ය ආයතනයකින් හෝ රජය පිළිගත් අධ්‍යාපන ආයතනයකින් (උදා:-ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනය හෝ පිළිගත් විශ්ව විද්‍යාලයක) සාමාන්‍ය කළමනාකරණය, රජයේ මුදල් රෙගුලාසි හා ගිණුම්, ආයතන සංග්‍රහය විෂයයන් අන්තර්ගත වූ සති අටකට (08) නොඅඩු පාඨමාලාවක සහතිකය ලබා ගැනීම අවශ්‍ය වේ.
V. රාජ්‍ය සේවා කොමිෂන් සභා චක්‍රලේඛ අංක 1/2020 අනුව විනයානුකූල දඩුවමක් ලබා නොතිබීම.
VI. අනුමත කාර්ය සාධන ඇගයීමේ පරිපාටිය අනුව පූර්වාසන්න වසර පහ (05) තුළ සතුටුදායක මට්ටමේ හෝ ඊට ඉහළ කාර්ය සාධනයක් පෙන්නුම් කර තිබීම.

4. උසස් කිරීමේ ක්‍රමය:

I. සම්මුඛ පරීක්ෂණය පැවැත්වෙන දිනට , 03 ඡේදයෙහි සඳහන් මූලික සුදුසුකම් සපුරා ඇති අයදුම්කරුවන් රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් පත් කරනු ලබන සම්මුඛ පරීක්ෂණ මණ්ඩලයක් මගින් පහත සඳහන් ලකුණු පරිපාටිය යටතේ යෝග්‍යතා ඇගයීමේ සම්මුඛ පරීක්ෂණයකට ලක් කර, එහිදී ලබා ගන්නා ලකුණුවල කුසලතා අනුපිළිවෙළ අනුව පවත්නා පුරප්පාඩු වලට සුදුස්සන් තෝරා ගනු ලැබේ.

සහකාර සුරාබදු කොමසාරිස්වරුන් නියෝජ්‍ය සුරාබදු කොමසාරිස් තනතුරට උසස් කිරීමට අදාළ යෝග්‍යතා ඇගයීමේ සම්මුඛ පරීක්ෂණය සඳහා වූ ලකුණු පරිපාටිය.

| | ලකුණු ලබා දෙන ප්‍රධාන ශීර්ෂ | උපරිම ලකුණු ප්‍රමාණය | | තෝරා ගැනීමට සලකා බලන අවම ලකුණු ප්‍රමාණය |
|---|---|---|---|---|
| 01 | සේවා පලපුරුද්ද<br>සහකාර සුරාබදු කොමසාරිස් තනතුරට පත් වී වසර තුනකට (03) පසුව එළඹෙන සේවා කාලය සඳහා පමණක් ලකුණු ලබා දෙන අතර, එලෙස වැඩිම අමතර සේවා කාලයක් සහිත නිලධාරියාට සේවා පලපුරුද්ද සඳහා වෙන් කර ඇති මුළු ලකුණු ප්‍රමාණයද සෙසු නිලධාරීන්ට සමානුපාතික ලෙස ද වන පරිදි ලකුණු ලබා දීම සිදු කෙරේ. | | 60 | |
| 02 | කුසලතාවය | | | |
| | (අ) කාර්ය සාධන ඇගයීම (පූර්වාසන්න වසර 05 සඳහා)<br>I. විශිෂ්ය - (ලකුණු 04)<br>II. සාමාන්‍ය ප්‍රමාණයට වඩා ඉහළ - (ලකුණු 03)<br>III. සාමාන්‍ය - (ලකුණු 02) | 20 | 35 | |
| | (ආ) උසස් අධ්‍යාපන සුදුසුකම් - නියෝජ්‍ය සුරාබදු කොමසාරිස්<br>I. විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්ව විද්‍යාලයකින් ලබා ගත් ඕනෑම පශ්වාත් උපාධි ඩිප්ලෝමාවක් සඳහා-ලකුණු 05,<br>II. විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්ව විද්‍යාලයකින් ලබා ගත් ඕනෑම පශ්වාත් උපාධියක් සඳහා-ලකුණු 10 | 10 | | අදාළ නොවේ. |
| | (ඇ) වෘත්තීය පුහුණු / විශේෂ පුහුණු<br>මෙම පුහුණුවීම් ක්ෂේත්‍රයට අදාල විය යුතු අතර, රජය විසින් පිළිගත් ආයතනයක් විසින් පිරිනමනු ලබන පුහුණුවීම් විය යුතුය. | 05 | | |
| 03 | සම්මුඛ පරීක්ෂණ මණ්ඩලයේ ඇගයීම<br>• නායකත්වය (ලකුණු 02)<br>• සන්නිවේදන කුසලතා (ලකුණු 02)<br>• පෞරුෂත්වය (ලකුණු 01) | 05 | 05 | |
| | මුළු ලකුණු | | 100 | |

05. සේවයේ නියුක්ත කරවීමේ කොන්දේසි

(I) මෙම තනතුරට පත්වීම ක්‍රියාත්මක වන දිනය ලෙස සලකනුයේ සම්මුඛ පරීක්ෂණය පැවැත්වෙන අවසාන දිනය වේ.

(II) දිවයිනේ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීමට නියම කරනු ලැබිය හැකිය.

06. අයදුම්පත් යොමු කිරීම

මෙම නිවේදනයේ අවසානයේ ඇති ආදර්ශ ආකෘතියට අනුව සකස් කරන ලද අයදුම්පත්‍රය අයදුම්පත් කැඳවීමේ අවසාන දිනය වන 2023/06/30 දිනය හෝ ඊට පෙර සුරාබදු කොමසාරිස් ජනරාල්, ශ්‍රී ලංකා සුරාබදු දෙපාර්තමේන්තුව,අංක 353,කෝට්ටේ පාර,රාජගිරිය යන ලිපිනයට ලැබෙන පරිදි ලියාපදිංචි තැපෑලෙන් හෝ අතින් ගෙනැවිත් භාර දිය යුතුය.
කවරයේ වම්පස ඉහල කෙලවරේ "නියෝජ්‍ය සුරාබදු කොමසාරිස් තනතුර" යනුවෙන් පැහැදිලිව සටහන් කළ යුතුය.

07. නියමිත දිනෙන් පසුව ලැබෙන අයදුම්පත් හා අසම්පූර්ණ අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ නියමය පරිදි.

ලේකම්,
මුදල්, ආර්ථික ස්ථායිකරණ සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍යාංශය

දිනය : 17/05/2023

අයදුම්පත් අංකය ………………………………

ශ්‍රී ලංකා සුරාබදු දෙපාර්තමේන්තුවේ නියෝජ්‍ය සුරාබදු කොමසාරිස් තනතුරට උසස් කිරීම සඳහා ඉල්ලුම් පත්‍රය.

01. කොටස (නිලධාරියා විසින් සම්පූර්ණ කිරීමට)

01. (අ) නිලධාරියාගේ නම:- ………………………………………………………………………

02. ලිපිනය:-

(I) කාර්යාලීය :- ………………………………………………………………………
(II) පෞද්ගලික :- ………………………………………………………………………
(III) ස්ථිර පදිංචිය :- ………………………………………………………………………

03. (I) උපන් දිනය :- ………………………………………………………………………
(II) ජාතික හැඳුනුම්පත් අංකය :- ……………………………………………………………

04. (අ) මුල් පත්වීමේ :-

(I) තනතුර :- ………………………………………………………………………
(II) පත්වීමේ දිනය :- ………………………………………………………………………
(III) සේවයේ ස්ථිර කළ දිනය :- ……………………………………………………………

(ආ) දැනට දරණ තනතුර පිළිබඳ තොරතුරු :-

(I) පත් වූ දිනය :- ………………………………………………………………………
(II) ස්ථිර කළ දිනය :- ………………………………………………………………………
(III) සේවා කාලය :- ………………………………………………………………………

(ඇ.) නියෝජ්‍ය සුරාබදු කොමසාරිස් තනතුරේ වැඩ බැලීමට පත් කළ දිනය :- …………..

05. සහකාර සුරාබදු කොමසාරිස්වරුන් සඳහා වූ කාර්යක්ෂමතා කඩඉම් (එබ්) පරීක්ෂණය

සමත් වී තිබේද ? ………………………… සමත් වූ දිනය :- ……………………………

06. ඉල්ලුම් කරන දිනයේ සිට පූර්වාසන්න පස් අවුරුදු කාලය තුළ ඔබ:

(I) සියළුම වැටුප් වර්ධක උපයාගෙන තිබේද ? ……………………………………………
(නැත්නම් විස්තර කරන්න)

(II) සිදු කර ඇති වරදක් සම්බන්ධයෙන් ඔබ විනයානුකූල දඩුවමකට භාජනය වී තිබේද?
………………………………………………………………………………………

07. (අ) ඔබ ලබා ඇති ප්‍රශංසා සහ විශිෂ්ට සේවා සහතික :

(I) ........................................................................................................................
(II) ........................................................................................................................
(III) ........................................................................................................................

(ආ) අදාල වෙනත් සුදුසුකම් (තහවුරු කිරීමට ඡායා පිටපත් ඉදිරිපත් කරන්න)

(I) ........................................................................................................................
(II) ........................................................................................................................
(III) ........................................................................................................................

08. ඔබ දිවයිනේ කවර හෝ ප්‍රදේශයක සේවය කිරීමට සුදුසු මානසික හා ශාරීරක යෝග්‍ය තත්වයක සිටින්නේදැයි සඳහන් කරන්න. :- ....................................................................

ඉහත සපයා ඇති විස්තර මාගේ දැනීමේ හා විශ්වාසයේ හැටියට නිවැරදි බව ප්‍රකාශ කරමි.
මා මෙම තනතුර සඳහා තෝරා ගත හොත් සුරාබදු ආඥා පනතේ නීති රෙගුලාසි වලට අමතරව රාජ්‍ය සේවාවේ පොදු කොන්දේසි වලට එකඟව, රාජ්‍ය සේවා කොමිෂන් සභාව මගින් පිරිනමනු ලබන දිවයිනේ කවර හෝ ප්‍රදේශයක සේවය සඳහා යාමට කැමති බවත් සහතික කර ප්‍රකාශ කරමි.

.......................................
අයදුම්කරුගේ අත්සන
දිනය :- 2023 ........................

II කොටස

අයදුම්පත නිර්දේශ කර ඉදිරිපත් කරමි.

..............................................................
සුරාබදු කොමසාරිස් / සුරාබදු කොමසාරිස් ජනරාල්

දිනය : 2023. ............................................